**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, ශුද්ධ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. මිලියන 446.6 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේදී ඌණතාවය රු.මිලියන 331.2 ක් ලෙස වාර්තා විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌණතාවය රු. මිලියන 115.4 කින් හෙවත් සියයට 34.8 කින් වැඩිවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද පරිපාලන හා ආයතනික වියදම් සහ කාර්යය මණ්ඩල පිරිවැය පිළිවෙලින් රු.මිලියන 56.2 කින් හා 81.1 කින් වැඩිවීම ප්‍රධාන හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

| | 2023 | 2022 | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | % |
| **<u>කොමිෂන් සභාවේ ආදායම</u>** | | | |
| අධ්‍යාපනික වැඩසටහන් | 11,629,061 | 8,671,966 | 34.0 |
| රජයේ ප්‍රදාන (මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය) | 176,438,871 | 172,252,739 | 2.4 |
| **<u>කොමිෂන් සභාවේ වියදම්</u>** | | | |
| කාර්යය මණ්ඩල වැටුප් | 202.907.059 | 160,983,569 | 26.0 |
| කාර්ය මණ්ඩල සුබසාධන සහ වෙනත් කාර්ය මණ්ඩල සම්බන්ධ ගෙවීම් | 49,696,830 | 37,965,470 | 30.9 |
| විදේශීය පුහුණුව සහ සංචාර | 13,522,257 | 7,081,485 | 90.9 |
| කුලී සහ කාර් පාක් කුලී | 140,069,454 | 110,895,458 | 26.3 |
| ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන, බාහිර සම්බන්ධතා, ප්‍රාග්ධන වෙළඳපොල අධ්‍යාපනය, ආවේක්ෂණය සහ විමර්ශන වියදම් - එකතුව | 36,029,791 | 50,328,063 | (28.4) |
| • ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය | 0 | 19,050,659 | (100) |
| • මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 21,773,762 | 10,278,137 | 111.8 |
| • අධ්‍යාපනික වැඩසටහන් | 1,959,364 | 1,678,495 | 16.7 |
| • ප්‍රසිද්ධිය සහ ප්‍රචාරණය | 0 | 147,015 | (100) |
| • වෙළඳපොල ආවේක්ෂණ පිරිවැය | 5,278,991 | 11,820,060 | (55.3) |

අ. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, ප්‍රතිඵල මූලික මූල්‍යකරණ සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2 ක් හා ආයෝජන මූලික මූල්‍යකරණ සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 8 ක් වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 10 ක් ලබා ගැනීමට කොමිෂන් සභාව හිමිකම් ලබයි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට, කොමිෂන් සභාවට එකතුව රු. මිලියන 533.39 (2019 දී රු. 81,124,254 ක්, 2020 දී රු. 11,720,560 ක් හා 2021 දී රු.මිලියන 104,804,128 හා 2022 දී රු. 171,674,294 ක් හා 2023 දී රු. 164,073,632 ක් වශයෙන්) ක් ව්‍යාපෘතියේ ප්‍රතිඵල මූලික මූල්‍යකරණ සංරචකයේ කොටසක් ලෙස ලැබී තිබුණි. තවද, ආයෝජන මූලික මූල්‍යකරණ සංරචකය යටතේ, හඳුනාගත් භාණ්ඩ හා උපදේශන සේවා ප්‍රසම්පාදනයට සහ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය සඳහා කොමිෂන් සභාවට අරමුදල් ලැබුණි. ව්‍යාපෘතිය අවසන්වන විට, ලෝක බැංකුව ඇ.එ.ජ.ඩොලර් 519,059.54

(රු. 163,324,066.66) ක් නිදහස් කර තිබුණි.

ආ. ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වියදමක් දරා නොතිබුණු අතර, ඉකුත් වර්ෂයේ වියදම රු. මිලියන 19.05 ක් විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් වියදම රු.මිලියන 21.77 ක් වූ අතර, එය පෙර වර්ෂයේ රු.මිලියන 10.28 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 11.49 ක හෙවත් සියයට 111.8 ක වැඩිවීමක් පිළිබිඹු කරන ලදි.

ඇ. 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156 වගන්තිය ප්‍රකාරව, සුරකුම්පත් වෙළඳපොළ දියුණු කිරීම, එහි කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවා ගැනීම සහ වෙනත් එහි සඳහන් කාර්යයන් සඳහා පනත යටතේ පනවනු ලබන සෙස් බද්ද භාවිතා කිරීමට අවසරය ලබා දී තිබේ. ඒ අනුව, කොමිෂන් සභාවේ වියදම් මූල්‍යනය කිරීම සඳහා සෙස් අරමුදලින් රු. මිලියන 446.66 ක් මාරු කර තිබුණු බව නිරීක්ෂණය විය. කොමිෂන් සභාවේ මුළු වියදම රු. මිලියන 665.58 ක් වූ අතර, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වියදම් දරා නොතිබුණි. කෙසේ වෙතත්, 2023 වර්ෂය සඳහා සංශෝධිත අයවැය ප්‍රකාරව, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා කොමිෂන් සභාව රු.3,000,000 ක් වෙන්කර කර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කොමිෂන් සභාව විසින් විමර්ශන පැවැත්වීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| අ | 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 16(ඩ) වගන්තිය අනුව, වෙළඳපොළ ආයතනයක, වෙළඳපොළ අතරමැදියකුගේ, ලියාපදිංචි තැනැත්තකුගේ, ලැයිස්තුගත පොදු සමාගමක හෝ ලැයිස්තුගත විදේශීය ආස්රිත්වයක යම් කටයුත්තක් පිළිබඳව විභාග කිරීම හා විමර්ශන පැවැත්වීම කොමිෂන් සභාව කළ යුතුය. තවද,<br>2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 16(ණ) වගන්තිය අනුව, යම් තැනැත්තකු විසින් කරන ලදැයි කියනු ලබන මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් රීතියක් හෝ විධානයක් හෝ ලබාදෙන ලද යම් උපදෙසක් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විමර්ශන පැවැත්විය යුතු සහ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති බලාත්මක කිරීමේ පියවර ගැනීම කළ යුතුය. ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2022 වර්ෂයෙන් ඉදිරියට ගෙනා විමර්ශන 62 ක් (අනු කරුණු 5 කට අදාල විමර්ශන ඇතුළතුව) පැවතුණු අතර, 2023 වර්ෂය තුළදී කොමිෂන් සභාව නව විමර්ශන 24 ක් ආරම්භ කරන ලදි. 2024 ජූනි 30 දිනට විමර්ශන පැවැත්වීමේ ප්‍රගතිය පහත පරිදිය. | කොමිෂන් සභාවේ විමර්ශන අංශය 2023 වර්ෂය තුළදී විමර්ශන 86 ක් සිදුකර 2023 දෙසැම්බර් 31 වන විට විමර්ශන 26 ක් අවසන් කරන ලදි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 වන විට සිදුකරමින් පවතින විමර්ශන 60 ක් පැවතුණි. ඉහත සඳහන් විමර්ශන අවසන් කිරීම පිණිස, විමර්ශනය හා බලාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ කමිටුව පත්කිරීම ඇතුළත් ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරමින් කොමිෂන් සභාව සමාලෝචිත වර්ෂය තුළදී විමර්ශන ක්‍රියාවලිය කඩිනම් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 ජූනි 30 වන විට විමර්ශන 86 කින් 55 ක් අවසන් | විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

| විමර්ශනයේ ස්වභාවය | 2023 වර්ෂයේ කළයුතු වූ විමර්ශන සංඛ්‍යාව | 2024 වර්ෂයේ ලැබුණු විමර්ශන සංඛ්‍යාව | 2024 ජුනි 30 දිනට තත්ත්වය | | |
|---|---|---|---|---|---|
| | | | අවසන් කළ විමර්ශන සංඛ්‍යාව | වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කළ සහ තවදුරටත් සමාලෝචනයට හෝ විමර්ශනයට නිර්දේශ කළ සංඛ්‍යාව | කරගෙන යන විමර්ශන සංඛ්‍යාව |
| අභ්‍යන්තර තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම | 26 | 2 | 14 | 8 | 6 |
| වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම | 42 | | 30 | 4 | 8 |
| වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම/අභ්‍යන්තර තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම | 4 | | 1 | 2 | 1 |
| පෙර විකුණුම් (Front Runing) | 6 | | 5 | 1 | - |
| අභ්‍යන්තර තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම/පෙර විකුණුම් | 1 | | - | 1 | - |
| පෙර විකුණුම් /වෙළෙඳපොළ විෂමාචාරය | 1 | | 1 | - | - |
| වෙළෙඳපොළ අයුතු හැසිරවීම හා තොරතුරු හෙළිදරව් කිරීමේ රීති උල්ලංඝනය කිරීම | 1 | | 1 | - | - |
| 132 (අ) වගන්තිය යටතේ වෙළෙඳපොළ විෂමාචාරය | 1 | | - | - | 1 |
| අත්පත්කර ගැනීමේ හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය | 1 | | - | 1 | - |
| සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත හා රීති උල්ලංඝනය කිරීම | 1 | | 1 | - | - |
| වෙළෙඳපොළ විෂමාචාරය | 1 | 1 | 1 | - | 1 |
| වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම/පෙර විකුණුම් | 1 | | 1 | | |
| එකතුව | 86 | 3 | 55 | 17 | 17 |

2024 ජුනි 30 දිනට පවතින විමර්ශන 17 න්, විමර්ශන 5 ක් 2023 වර්ෂයට පෙර ආරම්භ කර තිබුණි.

කිරීමට කොමිෂන් සභාවට හැකිවිය. තවද, විමර්ශන 17 කට අදාල වාර්තා වැඩිදුර සමාලෝචනය සඳහා විමර්ශන අධ්‍යක්ෂවරයා වෙත යොමු කර ඇති අතර 2024 ජුනි අවසන් වන විට විමර්ශන අංශය විසින් විමර්ශන 17 ක් සිදුකරමින් පැවතිණි.

ආ 2023 ජුලි 14 දින පැවති කොමිෂන් සභාවේ 487 වැනි රැස්වීමේදී, කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විමර්ශන අධීක්ෂණය කිරීමේ කමිටුවක් පත්කිරීමට තීරණය කර තිබුණු අතර, කමිටුව 2023 ජුලි සිට 2024 මැයි දක්වා 13 වතාවක් රැස් වී තිබුණි. කෙසේ වෙතත්, කමිටුවේ රැස්වීම් සූදානම් කරන හා පවත්වන්නේ කෙසේද යන්න පිළිබඳව අනුමත විමර්ශන නියමයන්/ රාමුවක් (Terms of Reference –TOR or Framework) නිරීක්ෂණය නොවීය.

විමර්ශන හා බලාත්මක කිරීම සඳහා ඉහත සඳහන් අධීක්ෂණ කමිටුව වෙනුවෙන් විමර්ශන නියමයන් කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කරනු ලැබේ.

කමිටුව සඳහා විමර්ශන නියමයන් පැවතීම අවශ්‍ය වේ.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

**විගණන නිරීක්ෂණය**

අ (i) කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ විධායක වර්ගීකරණයට අයත්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අධ්‍යක්ෂක, අවේක්ෂණ අධ්‍යක්ෂක, බාහිර සම්බන්ධතා අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂකවරු 9 න් 3 ක්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 9 න් 4 ක්, කළමනාකරුවන් 16

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

කොමිෂන් සභාව 2021 සිට ආරම්භ කර වර්ෂ 5 ක කාල පරිච්ඡේදයක් සඳහා ඉහත කාර්යය මණ්ඩලය අනුමත කරන ලදි. කොමිෂන් සභාව ඉහත පුරප්පාඩුවලින් බොහොමයක් පිරවීම සඳහා

**නිර්දේශය**

පවතින ප්‍රධාන තනතුරු පිරවීම අවශ්‍ය වේ.

න් 4 ක්, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් 22 න් 7 ක් හා සහකාර කළමනාකරුවන් 49 න් 24 ක් 2024 ජූනි 10 වන විට සැලකිය යුතු කාලයක් තිස්සේ පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. කළමනාකරණ තනතුරු පුරප්පාඩුව පැවතීම කොමිෂන් සභාවේ ඵලදායී ක්‍රියාකාරීත්වයට බලපෑ හැකිය.

(ii) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත අනුව, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොලවල් සංවර්ධනය කිරීම කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලින් එකක් වේ. කෙසේ වෙතත්, ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත්කර නොමැති අතර 2024 ජූනි 30 වන විට වසර 3 කට වඩා කට වැඩි කාලයක් වැඩබැලීමේ පදනම මත එය හසුරුවනු ලැබේ. තවද, කොමිෂන් සභාව මෙම තනතුර පිරවීම සඳහා 2022 සැප්තැම්බර්වලින් පසු සුදුසු අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා නොතිබුණි.

(iii) සහකාර කළමනාකරුවන් බඳවාගැනීමට දැන්වීම 2024 ජනවාරි ප්‍රසිද්ධ කර තිබුණද, 2024 ජූනි අවසන්වන තුරු ඔවුන් බඳවාගෙන නොතිබුණි.

අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. මෙම තනතුරු සඳහා සුදුසු පුද්ගලයන් හඳුනාගැනීමට කොමිෂන් සභාවට නොහැකි වී ඇත. සුදුසු අපේක්ෂකයකු හඳුනාගත් සෑම විටම, එවැනි අපේක්ෂකයන් තනතුර භාරගැනීමට උනන්දුවක් නොවන්නේ ප්‍රධාන වශයෙන්ම ඔවුන්ට පිරිනමනු ලබන අඩු වැටුප් නිසාවෙනි. 2024 මූල්‍ය වර්ෂය තුළදී පිරවීම සඳහා ඉතා වැදගත් වන ප්‍රධාන තනතුරු 5 ක් කොමිෂන් සභාව දැනටමත් හඳුනාගෙන ඇත. මෙම තනතුරුවලින් 2 ක් දැනටමත් පුරවා ඇති අතර ඉතිරි තනතුරු 3 පත්කිරීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. ඉතිරිය ආයතනයේ අවශ්‍යතාවය මත පදනම්ව ඉදිරියේදී පුරවනු ලැබේ. ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන, බාහිර සම්බන්ධතා හා ප්‍රාග්ධන වෙළඳපොල අධ්‍යාපනය යන අංශ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් අධීක්ෂණය කරන ලැබේ.

(ආ) **වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත්කිරීම**

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 19 (1) වගන්තිය අනුව, අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත්කරනු ලැබිය යුතු අතර එකී අධ්‍යක්ෂ ජනරාල්වරයා එහි ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික ඇතුළු සේවා නියුක්තියේ කොන්දේසි කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතුය. තවද, ඉහත පනතේ 19(4) වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කොමිෂන් සභවේ අනුමැතිය ඇතිව, එසේ කිරීමට අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන කවර හෝ විටකදී, මේ පනතින් ඔහුට පිරිනමන ලද හෝ පවරන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් නිලධරයකුට හෝ සේවකයකුට පවරනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව, එම නිලධරයා හෝ සේවකයා විසින්, එම බලය, කර්තව්‍යය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කරනු

2024 අප්‍රේල් මාසයේදී කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හදිසි රෝගී තත්වයක් ඇතිවීමෙන් ඔහුට රෝහල්ගතවීමට සිදුවිය. කොමිෂන් සභාවේ මෙහෙයුම් පවත්වාගෙන යාමට වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත්කිරීමට තීරණය කරන ලදි. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නොපැමිණීමේ කාලය අවිනිශ්චිතවීම හේතුවෙන් කොමිෂන් සභාව වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා තෝරා ගත්තේ ඔහු ඊළඟට ජ්‍යෙෂ්ඨ නිලධාරියා වීම නිසාවෙනි. පනතේ මෙම තත්වය නිශ්චිතව ආමන්ත්‍රණය කර නොමැති බැවින් ආයතන සංග්‍රහයට අනුකූලව මෙම තීරණය ගන්නා ලදි. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩබලන

අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගැනීමට නිර්දේශ කෙරේ.

ලැබිය යුතුය. කෙසේ වෙතත්, 2024 අප්‍රේල් 16 දිනැති අධ්‍යක්ෂ (මානව සම්පත් හා සංවිධාන පරිවර්තන) ගේ චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව, අධ්‍යක්ෂ ජනරාල්වරයා පෞද්ගලික අවශ්‍යතාවයක් මත කාර්යාලයෙන් බැහැරව සිටින බැවින්, කොමිෂන් සභාව වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කර, ඔහුට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යයන්හි වගකීම ඉටු කිරීමට අධිකාරිය පවරා තිබුණි. අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීමේ අධිකාරිය අමාත්‍යවරයා සතුව පැවතියද, මෙම පත්කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගෙන් අනුමැතිය/එකඟතාවය ලබාගෙන නොතිබුණි.

අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත්කිරීමෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වෛද්‍ය නිවාඩු කාලය තුළ සංවිධානයේ සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කරන ලදි.

(ඇ) **කළමනාකාර අභ්‍යාසලාභීන් පත්කිරීම**

කොමිෂන් සභාව කළමනාකාර අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා 2023 ජූලි මාසයේදී දැන්වීම් පළකල අතර, 2024 මුලදී එවැනි අභ්‍යාසලාභීන් 10 දෙනෙකු බඳවාගන්නා ලදි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දැන්වීම ප්‍රකාරව, දැඩි තෝරාගැනීමේ ක්‍රියාවලියකින් පසුව කළමනාකාර අභ්‍යාසලාභීන් තෝරාගන්නා බව සඳහන් විය. කෙසේ වෙතත්, තෝරාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව විස්තර (ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම සහ/හෝ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි) දැන්වීමෙහි සඳහන් නොවිණි. තවද, තෝරාගනු ලබන අභ්‍යාසලාභීන්ට ගෙවීමට අපේක්ෂිත දීමනාවේ වටිනාකම දැන්වීමෙහි සඳහන් නොවීය.

(ii) 2021 ජනවාරි 13 දින පැවති 445 වන කොමිෂන් සභා රැස්වීමේදී අනුමත වූ හා 2021 ජනවාරි 13 දින සිට ක්‍රියාත්මක වන බඳවා ගැනීමේ පටිපාටිය මගින් කොමිෂන් සභාවට කළමනාකාර අභ්‍යාසලාභීන් බඳවාගන්නා අකාරයන් ඇතුළත් නොවීය.

(iii) අයදුම්පත් 1,000 කට වඩා ලැබීමෙන් පසුව, සුදුසු අයදුම්කරුවන් තෝරාගැනීමේ පළමු පියවර ලෙස ලිඛිත පරීක්ෂණයක් බාහිර පාර්ශවයකගේ සහාය ඇතිව පැවැත්වීමට කොමිෂන් සභාව තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, තනතුර සඳහා අයදුම් කරන අවස්ථාවේදී අයදුම්කරුවන්ට එය සන්නිවේදනය කර නොතිබුණි.

(iv) බාහිර පාර්ශවයක් විසින් ලිඛිත පරීක්ෂණය පැවැත්වුව ද, විභාග ප්‍රශ්නපත්‍ර අභ්‍යන්තරව පිළියෙල කර තිබුණි.

කොමිෂන් සභාව සියලු පුරප්පාඩු සඳහා එකම බඳවාගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කරයි. වැටුප්, තෝරාගැනීමේ ක්‍රියාවලිය සහ දීමනා සාමාන්‍යයෙන් දැන්වීමෙහි ඇතුළත් කරනු නොලැබේ. ලිඛිත විභාගය පිළිබඳව කෙටිලැයිස්තුගත කරන ලද අපේක්ෂකයන්ට පමණක් දැනුම්දුන් අතර, ලිඛිත විභාගය සාර්ථක වූ අය සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදි. විභාග ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොල, විදේශ ප්‍රාග්ධන වෙළඳපොල, සාමාන්‍ය දැනීම, බුද්ධිමය ප්‍රශ්න ආදියෙන් සමන්විත විය. කළමනාකාර අභ්‍යාසලාභීන් බඳවා ගැනීම ඇතුළත් කරමින් පවතින බඳවා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කරනු ලැබේ.

දැන්වීමෙහි, තෝරාගැනීමේ ක්‍රියාවලිය සහ දීමනා ඇතුළත් කිරීමට සහ කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවාගැනීමේ ක්‍රියාවලිය ඇතුළත් කරමින් බඳවාගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීමට නිර්දේශ කරනු ලැබේ.

(ඇ) **චර්යාධර්ම සංග්‍රහයක් ස්ථාපිත කිරීම**

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 20(4) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් චර්යාධර්ම සංග්‍රහයක් පිහිටුවනු ලැබිය යුතු අතර එය කොමිෂන් සභාවේ නිලධරයන්ට හා සේවකයන්ට අදාල විය යුතුය. සමාජිකයන්ගේ හා සේවා නියුක්තයන්ගේ චර්යාව සම්බන්ධව පවතින රෙගුලාසිය 1997 සිට භාවිතා කරන අතර එය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ ඉහත යොමුගත වගන්ති ඇතුළත් කරමින් යාවත්කාලීන කර නොතිබුණි. | අදහස් දැක්වීම් සටහන් කර ගන්නා ලද අතර කොමිෂන් සභාව, චර්යාධර්ම සංග්‍රහය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියේ නිරත වේ. | පවතින චර්යා ධර්ම සංග්‍රහය යාවත්කාලීන කිරීමට නිර්දේශ කරනු ලැබේ. |

## 3.3 සේවා සපයන්නන් සමඟ සේවා මට්ටමේ ගිවිසුම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවා ගිවිසුමේ වලංගු කාල සීමාව ආරම්භවීමෙන් පසුව සැලකිය යුතු කාල ප්‍රමාදයන් සහිතව අදාල සේවා සපයන්නන් සමඟ සේවා මට්ටමේ ගිවිසුම් 11 කට එළඹ ඇති බව නිරීක්ෂණය විය. | සේවා මට්ටමේ ගිවිසුම් ප්‍රමාදවී අත්සන් කළද, කාලපරිච්ඡේදය තුළදී කිසිදු සේවා සපයන්නකුගේ සේවා බිඳවැටීම් නොතිබුණි. සේවා මට්ටමේ ගිවිසුම් ක්‍රියා විරහිත කාලපරිච්ඡේදය තුළ පද්ධති කාර්යසාධනයට බලපෑමක් නොවූ බව සහතික කෙරේ. සේවා මට්ටමේ ගිවිසුම් ක්‍රියාත්මක වන දිනට හෝ ඊට පෙර ඒවා අත්සන් කිරීම සහතික කිරීමට පියවර ගනු ලැබේ. | සේවා ගිවිසුම් ඒවා ක්‍රියාත්මක වන දිනට හෝ ඊට පෙර අත්සන් කිරීම අවශ්‍ය වේ. |

## 3.4 කාර්ය මණ්ඩලයට මාස දහයක දළ වැටුපකට සමාන වටිනාකමක කාර්ය මණ්ඩල ණය ලබාදීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව එහි 485 වැනි රැස්වීමේදී, කොන්දේසිවලට යටත්ව, දැනට පවතින කාර්යය මණ්ඩල ණය පහසුකම මාස 10 ක දළ වැටුපකට සමාන වටිනාකම හෝ රු.2,000,000 යන එකින් අඩු අගය ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කර තිබුණි. කාර්යය මණ්ඩල ණය පහසුකම සඳහා සුදුසුකම් ලැබීමේ එක් අරමුණක් වන්නේ "අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය අනුව මූල්‍ය සහාය ලැබිය යුතු වෙනත් අරමුණු" වේ. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා මූල්‍ය සහාය ලබාදීමේ අවස්ථා තීරණය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව විස්තර ඉහත කොමිෂන් සභා තීරණයේ දක්වා නොතිබුණි. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලද අතර සුදුසුකම් නිර්ණායක නැවත සලකා බලනු ලැබේ. | සුදුසුකම් නිර්ණායක නැවත සලකා බැලීම අවශ්‍ය වේ. |

### 3.5 සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව වෙළඳපොල ආවේක්ෂණය සිදුකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත ප්‍රකාරව, කොමිෂන් සභාව එම පනත උල්ලංඝණය කරන ගනුදෙනු අනාවරණය කර ගැනීම හා වැළැක්වීමේ අරමුණින් යුක්තව කොළඹ කොටස් වෙළඳපොළේ සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳ ආවේක්ෂණය සිදුකිරීම කළ යුතුය. ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2023 වර්ෂය තුළදී කොමිෂන් සභාව අවේක්ෂණ යොමුකිරීම් (referrals) 12 ක් හා අවේක්ෂණ සටහන් 1 ක් ජනිත කරන ලදි. තවද, කොමිෂන් සභාව විවිධ සමාජ මාධ්‍ය වේදිකාවල හුවමාරුවන තොරතුරු අධීක්ෂණය කරන අතර, ඉලක්කගත මිලකරණය, ආයෝජන උපදේශකරණය යනාදිය පිළිබඳව සමාජ මාධ්‍ය වේදිකාවන් වල හුවමාරුවන විවිධ පළ කිරීම් පිළිබඳව තවදුරටත් අධීක්ෂණය කිරීමට යෝජනා කෙරේ. තවද, කොමිෂන් සභාව වෙළඳපොළ අධීක්ෂණය හා ආවේක්ෂණ පිරිවැය ලෙස අයවැය තුළ රු. 16,409,980 ක් වෙන් කර තිබුණ ද, 2023 වර්ෂය තුළදී රු.5,278,991 ක් හෙවත් සියයට 32 ක් පමණක් වියදම් කර තිබුණි. | කොමිෂන් සභාව කොටස් තැරැව්කරුවන්ගෙන්, ආයෝජන උපදේශකයන්ගෙන්, අනුකූලතා නිලධාරීන්ගෙන් හා ආයෝජකයන්ගෙන් විවිධ සැකකටයුතු වැරදි පිළිබඳව දුරකථන ඇමතුම්, ලිපි හා ප්‍රකාශ සටහන්කර ගැනීම් හරහා පැහැදිලි කරගැනීම් ලබාගනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාජ පරිසරයේ සන්දර්භය හා පවතින වෙළඳපොල තත්වයන් සැලකිල්ලට ගනිමින් විෂමාචාරය සම්බන්ධව කාලෝචිත හා සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ අනුව, නිරීක්ෂණයන් සම්බන්ධයෙන් ආයෝජකයන්ගෙන් දුරකථන ඇමතුම් හරහා පැහැදිලිකරගැනීම් කඩිනමින් ලබාගනු ලබන අතර සමහර නිරීක්ෂණ කොමිෂන් සභාවේ නිල ෆේස්බුක්/යූටියුබ් ගිණුම් මඟින් "නුසුදුසු අන්තර්ගතයන් පළකිරීම වෙනුවෙන්" අදාල සමාජ මාධ්‍ය වේදිකාවන්ට වාර්තා කරනු ලබයි. 2023 වර්ෂය තුළදී, හඳුනාගත් ආයෝජකයන්ට "අවවාද" නිකුත් කරන ලද අතර, ඇතැම් හඳුනාගත් ආයෝජකයන්ට "හේතු දැක්වීමේ" ලිපි නිකුත් කරන ලදි. | ඉලක්කගත මිලකරණය, ආයෝජන උපදේශකරණය යනාදිය පිළිබඳව සමාජ මාධ්‍ය වේදිකාවන්වල හුවමාරුවන විවිධ පළ කිරීම් පිළිබඳව තවදුරටත් අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

### 3.6 මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සහ අවදානම් කමිටුවේ රැස්වීම් පැවැත්වීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රකාශිත තොරතුරුවලට අනුව, කොමිෂන් සභාව, අවදානම් කමිටුව සහ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වශයෙන් අනු කමිටු දෙකක් පත්කර තිබුණි. කෙසේ වෙතත්, එම කමිටු සඳහා විමර්ශන නියමයන් (TOR) නොතිබුණි. | කමිටු දෙක සඳහා කෙටුම්පත් විමර්ශන නියමයන් කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. | අනුමත විමර්ශන නියමයන් පැවතීම අවශ්‍ය වේ. |